53476



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**
※ **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** පහත දැක්වෙන (**අ**), (**ආ**), (**ඉ**), (**ඊ**) හා (**උ**) උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (**ඌ**) හා (**එ**) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(**අ**) 'තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය. ඊට නිසි පිළියම් දන්නා කෙනකුන් ගෙනවුත් පිළියමක් කරව' යි උන්ගේ අදහස් ආභරණය කළ ලෙසින් ම නොහැඟුණා සේ කිවුය. බමුණාණෝ ඒ අසා 'පින්වත් බැමිණි කුමක් කියයි ද? පිළියමට වෙදවරුන් ගෙනා කල වෙදකම් නිමන තෙක් බතුත් දුනමැනව. මංකුලිත් දුනමැනව. කෙළවර මිලත් දුනමැනව. බලවත් ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මදෙකින් සැහි නොයෙයි. හීදඬු මිටියකින් හීදණ්ඩක් හයාගත් කලට අඩුව පෙනෙන්නා සේ කවර තරම් වස්තුයෙකත් දවසක් වුවත් ප්‍රයෝජන වුන් කලට අගය අඩු වන්නා සේ සම්පත් අඩු වන නියාව කලන්දක ජාතකයෙහි ලේනාණන් නඟුට වැදගත් පැන් ඉසි පමණකින් මූද පැන් අඩු වූ නියායෙනුත් දනමනා වේ දැ'යි යන්න තමන් නොදත් හෙයින් **දාෂ්ටාන්ත** කොට නොකීවත් සෙසු ලෙස කථා කීමෙන් තමන් ඉතා ලාමක නියාව හැඟවූහ.

(i) පුත්‍රයාට ප්‍රතිකාර සඳහා වෛද්‍යවරුන් කැඳවූ කල දිය යුතු වන්නේ මොනවා ද?
(ii) බමුණා තම පුතුට බෙහෙත් කරන කල තම වස්තුව වැය වන ස්වරූපය පිළිබඳ ව කියැවෙන උපමාව කුමක් ද?
(iii) 'තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය.' මෙය ලිහිල් බසින් ලියන්න.
(iv) '**දාෂ්ටාන්ත**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(**ආ**) අභයරාජකුමාරයෝ තමන්ගේ ගෙට ගොස් ජීවකයන් කැඳවා රජ්ජුරුවන් කී පවත් කියා "රජගෙට මා හා කැටිව එව"යි කීහ. එවේලෙහි ජීවකයෝ යහපතැයි ගිවිස ඒ ව්‍යාධියට තරම් ඖෂධයක් භාවිත කොට නිය හස්සේ සඟවාගෙන පියාණන් හා කැටිව රජගෙට ගොස් රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුවෝ ජීවකයන් දැක උන්ගේ දර්ශනයෙහි පැහැද ඔවුන් තනි කොට මතුමාලට ගෙන ගොස් තමන්ගේ ව්‍යාධිය දැක්වූහ. එවේලෙහි ජීවකයෝ ව්‍යාධිය බලා "අද ම සන්හිඳුවාලමි. දිවි පමණින් මතු ඇති විය නොදෙමි. මාගේ **සුරුකම්** බලාවදාළ මැනවැ"යි වාසි කියාලා එම විට ම නියහස්සෙහි තුබූ ඖෂධය මැත් කොට පිළකය මතුයෙහි ආලේප කළහ. එකෙණෙහි ආලේපය හා සමඟ භගන්ධරාබාධය සන්හිඳී පිළකය ඇති වූ තැන කොතෙන බවත් නොදැනෙන සේ අන්තර්ධාන විය.

(i) රජතුමාට ප්‍රතිකාර කිරීම සඳහා ජීවක වෛද්‍යවරයාගේ පූර්ව සූදානම කෙබඳු ද?
(ii) රජතුමා, තමාගේ ව්‍යාධිය ජීවකට දැක්වූයේ කවර ස්ථානයක දී ද?
(iii) 'උන්ගේ දර්ශනයෙහි පැහැද' යන්න ලිහිල් බසින් ලියන්න.
(iv) '**සුරුකම්**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

(ඉ) "මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ **වියෝග ශෝකයෙන්** හඬා පෙර මා හා සමග එක් ව කෙළ ඇවිද ලියමඬුලු වන ලැහැප් අතල ගල් ගං හිස් ගිරිමුදුන් රුක් යට වැලිතලාදී වූ ඒ ඒ තැන්හි අඬා ඇවිදිනා තීගේ අදෝනා නම් අපේක්ෂා කරන්නා වූ මම හඬන්නෙමි" යනාදීන් මෙසේ ඒ මහ බෝසත් අඬා මල් ඇතිරිය මත්තේ ස්මෘති විප්‍රයෝගී ව අනික් ඇලයට පෙරළී වැද හොත්තේය. රජ ද විදි තැන ම සිටියේය. චන්ද්‍රිකා නම් කින්නරාඞ්ගනා තොම මහ බෝසත්හු මෙලෙස හඬනත් තමාගේ කෙළියෙහි ඇලී මත් වන ලද්දී බෝසත්හු විත් කැ නියාවත් නොදන්නීය. එතකුදු උවත් මහ බෝසත්හු විසංඥ ව වැදහොත් නියාව දැක "ඇයි මාගේ ස්වාමි පුරුෂයාණන් මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන් දැ"යි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වැගෙන්නා වූ ලේ දැක ප්‍රිය වූ ස්වාමි පුත්‍රයා කෙරෙහි සෝකය දරා ගත නොහී ආක්‍රෝශ බෙණෙමින් මහ හඬින් හඬන්ට වන්හ.

(i) මහ බෝසතුන් ශෝකයට පත් වූයේ කුමක් නිසා ද?

(ii) බෝසතුන් සිහිසුන් ව මල් ඇතිරියෙහි වැතිර සිටි වග කිදුරියට නොදැනුණේ මන්ද?

(iii) "මී නියාවූ මගේ නැටුම් නොබලා වැදහෝනට කවර දුකෙක් උපන්දැ'යි" මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

(iv) '**වියෝග ශෝකයෙන්**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(ඊ) එකල්හි ස්වර්ණතිලකාවගේ පියා ද යහපතැයි ගිවිස විසිතුරු වූ කර්මාන්ත ඇති දහසක් වටනා පලසකින් දුවගේ ශරීරය වසා පොරවා තමා ගායනා කරන වීණාදි වූ තූර්යභාණ්ඩ ගෙන්වා ගෙන ස්වර්ණතිලකාවන් හා සමඟ මග බැස නික්මිණි. මෙසේ නික්මුණාවූ ඒ චණ්ඩාල බ්‍රාහ්මණතෙම අතරමග එක් නුවරෙක රජ්ජුරු කෙනකුන් දැක වීණා ගායනා කරනුයේ ස්වර්ණතිලකාව තමා පිටිපස හිඳිනා සේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්ට පටන් ගත. එකල්හි ඔහු පිටිපස හුන්නාවූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රීලීලාවෙන් යුක්ත ව මදලස බැල්මෙකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මදක් පහකොට **ශරීරප්‍රභා** දක්වාලුව. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලොක හා රූපසම්පත්තිය දැක කාමයෙන් විසංඥ ව සිහි මුළා ව මඳ ඇසිල්ලකින් ලබනලද ආස්වාද ඇති ව...

(i) ස්වර්ණතිලකාගේ ශරීරය වසා පොරවා තිබුණේ කුමකින් ද?

(ii) චණ්ඩාල බ්‍රාහ්මණයාණන් ස්වර්ණතිලකා සමග යන විට රැගෙන ගියේ මොනවා ද?

(iii) 'නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) '**ශරීරප්‍රභා**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

(උ) ලෙස උදය දිවයු රු
දුරුකර ඇඳුරු දුක් දු රු
පොබයා මුව තඹු රු
මෙසේ පැවසී තෙපුල් **පුරදු රු**

ගුත්තිල ඇදුරු ස ද
ඔහු වාදයට වන් ස ද
වයව තත් සිඳ සි ද
නැගෙයි නද සිඳි තතින් මනන ද

(i) ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදය මනහර වූයේ කුමන හේතුවක් නිසා ද?

(ii) පළමු වන පද්‍යයෙහි ඇති රූපකාලංකාරයක් උපුටා දක්වන්න.

(iii) 'ගුත්තිල ඇදුරු ස ද
ඔහු වාදයට වන් ස ද' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) '**පුරදුරු**' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

- (ඌ) සහ (ඍ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "බමුණ, හඳුනන මග යමින් සිට මං විචාරන්නා සේ මා අතින් කුමක් නිසා විචාරයි ද?"

(ii) "අප පන් සියය වෙහෙසයි ද?"

(iii) "තොප කියේ කාරණා මය. ඥානවන්තයන් සිතුවමනා සිතුවිල්ලෙක් මය."

(iv) "අපගේ ආචාරීන් වහන්සේ දක්නා කැමැත්තම්හ."

(v) "උඹට සාක්කියට කවුරුත් ඉන්නවා ද?"

(vi) "මා කෙරේ සෙනේ ඇති
කෙනෙක් නැත මුළු ලොවේ
පාලු කතරකි මා හද,
නැත එහි සෙවනක්..."

(vii) "කොහෙදැ මේ මහමද්දහනේ යන්නේ? ඔළුවට අමුඩ ලේන්සුව වත් දාගන්නේ නැතුව"

(ලකුණු 03 × 4 = 12 යි.)

(ඍ) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය සහ වස්තු විෂය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදය කරන්න.

සිරිපා සීතල තොවේ මේ
දැවටෙන්නේ සේද සළුවක් සේ
සතුටු සිතුවිල්ලක් මිස
සිත පුරා

අලුත් ලෙයක් නහර වැල් දිගේ ගලයි
අලුත් මල් පිපී තිබේ නම් නොදත්
අලුත් ලයකි සැදැහැවතුන්ගේ කරුණා හඬෙහි
සැහැල්ලු ය සිරුර, නැත විඩාවක්

නිමිත්තක් නැති සතුටකි

පහළට කරුණා කරමින්
සිත තුළ ද සැරි සරමි
නිමිත්ත සොයා මේ සතුටු හැඟුමේ

අමතක වූ වචනයක් මෙන්
දිව අග ඇති
දනිමි එහෙත් නොදනිමි මේ සතුට

කොයිබ සිට ආවෙ ද
කොයි වෙසින් ආවෙ ද මේ සතුට

යමතම්න් නමුත් ඇසෙනා
ඝාණ්ටාර හඬ මළුවේ
සිත රැගෙන ගියා ආපහු
අමතක අඳුරු වලා බිඳිමින්

ඉර සේවය බලනා
දුම්බර සිට ආ නඩයක් මැද හිඳ
සිනා සුණා දැරියක්
හිරිමල් සිනා පා

(ලකුණු 12 යි.)

[හතරවැනි පිටුව බලන්න.

2. 'ධර්මසේන හිමියන්ගේ අභිප්‍රාය ශ්‍රද්ධා බුද්ධි සම්පන්න සමාජයක් බිහි කිරීම ය.' සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**නැත හොත්**

ස්වකීය අරමුණු ඉෂ්ට කර ගැනීමෙහි ලා ඒ ඒ චරිත අවස්ථෝචිත ව ක්‍රියාත්මක වන ආකාරය සියුම් ව ප්‍රතිනිර්මාණය කිරීමට ජාතක කථා කර්තෘවරුන් දැක්වූ කුසලතාව නියමිත කථා ඇසුරින් විමසන්න. (ලකුණු 15 යි.)

3. මේ ප්‍රශ්නයෙහි **'අ'** කොටසට ද **'ආ'** සහ **'ඇ'** කොටස් දෙකෙන් **එක්** කොටසකට ද පිළිතුරු සපයන්න.

**(අ)** "පද්‍යකරණයෙහි ලා නව ප්‍රවේශයකට යොමු වීම ගම්පොළ සාහිත්‍ය අවධියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි." විමසන්න. (ලකුණු 07 යි.)

**(ආ)** සිංහල බණකථා සාහිත්‍යය ශ්‍රාවක-පාඨක ජනයා අතර වඩාත් ජනප්‍රිය කරවීමට පූජාවලි කතුවරයාගෙන් සැපයුණු දායකත්වය නියමිත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

**(ඇ)** කාමයෙන් මුළා වීම පුද්ගල පරිහානියට හේතු වන ආකාරය සද්ධර්මාලංකාරයේ නියමිත කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

4. ශබ්දයේ හා අර්ථයේ සුසංයෝගය ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇති ආකාරය විමසන්න. (ලකුණු 15 යි.)

5. කාලීන සමාජ යථාර්ථය නිරූපණයෙහි ලා බැද්දේගම කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය අගයන්න. (ලකුණු 15 යි.)

6. මාපිය සෙනෙහසේ අපූර්වත්වය නිරූපණය කෙරෙන විශිෂ්ට නිර්මාණයක් ලෙස සයිමන් නවගත්තේගමගේ ස්නේහය කෙටිකතාව විචාරයට ලක්කරන්න. (ලකුණු 15 යි.)

7. කවියේ ආකෘතිය සහ රසෝත්පත්තිය අතර පවත්නා සහසම්බන්ධතාව නිදහස් කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් කවීන්ගේ නිර්දිෂ්ට පද්‍ය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

8. 'අනපේක්ෂිත සිද්ධි දාමයක ප්‍රතිඵල ලෙසින් පෙමතො ජායතී සොකො නාට්‍යය ඛේදාන්තයක් බවට පත් වේ.' විමසන්න. (ලකුණු 15 යි.)

* * *